# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2037/15 - 2017 සැප්තැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2017.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78(xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින් (2017 ජුනි මස 30 වැනි දින අංක 2025/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමය මගින් අවසන් වරට සංශෝධිත) 1995 නොවැම්බර් මස 07 වැනි දින අංක 896/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයට අදාළව එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''වෛද්‍ය සහ සමාන්තර විද්‍යා පීඨය'' යන සටහන සහ II වන තීරයේ ඊට අනුරූප සටහන්වලට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

| ''*I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| තාක්ෂණ විද්‍යා පීඨය | 1. ජෛව ක්‍රියාවලි තාක්ෂණ අධ්‍යයන අංශය |
| | 2. විදුලි සහ ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයන අංශය |
| | 3. ආහාර තාක්ෂණ අධ්‍යයන අංශය |
| | 4. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අධ්‍යයන අංශය |
| | 5. ද්‍රව්‍ය තාක්ෂණ අධ්‍යයන අංශය.'' |

ලක්ෂ්මන් කිරිඇල්ල,
*උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.*

2017 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

10-98

1A - PG 3697 — 508 (2017/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*